# වාර්ෂික වාර්තාව

# 2017

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**




ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම




ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

# 2017 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ
# අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| ආචාර්ය නටාෂා බාලේන්ද්‍ර මහත්මිය | සභාපති<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල<br>ශ්‍රී ජයවර්ධනපුර |
| නීතිඥ මරිනි ද ලිවේරා මහත්මිය<br>(2017 අප්‍රේල් මස සිට) | සභාපති<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල<br>ශ්‍රී ජයවර්ධනපුර |
| නීතිඥ සජීව සමරනායක මහතා<br>(2017 ජූනි මස දක්වා)<br><br>නීතිඥ එච්. එම්. අබයරත්න මහතා<br>(2017 දෙසැම්බර් 04 සිට) | නියෝජ්‍ය සභාපති<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල<br>ශ්‍රී ජයවර්ධනපුර |
| වෛද්‍ය එස්. පී. කඳපොල ආරච්චිගේ මහතා | මනෝ වෛද්‍ය විශේෂඥ<br>මූලික රෝහල<br>ගම්පහ |
| වෛද්‍ය යූ. ඒ. කේ. තෙන්නකෝන් මහතා | අධිකරණ වෛද්‍ය නිලධාරි<br>විෂ වේදය හා නීති වෛද්‍ය ආයතනය<br>බොරැල්ල<br>කොළඹ 08 |
| ආචාර්ය ටී. ස්වින්ද්‍රන් මහතා | මනෝවිද්‍යාඥ<br>අංක 06, පෙරේරා මාවත<br>කොළඹ 10 |
| කේ. වෛද්‍යරත්න මහතා<br><br>ඩී. පී. ජේ. ද ලිවේරා මහතා<br>(2017 ජූනි සිට) | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්<br>නීතිපති දෙපාර්තමේන්තුව<br>කොළඹ 12 |
| එම්. ආර්. ලතීෆ් මහතා | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති<br>විශේෂ කාර්යබලකා මූලස්ථානය<br>බෞද්ධාලෝක මාවත<br>කොළඹ 07 |

| | |
|---|---|
| චන්දිමා සිගේරා මහත්මිය | කොමසාරිස්<br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>II වන අදියර<br>සෙත්සිරිපාය<br>බත්තරමුල්ල |
| චාන්දනී අමරතුංග මහත්මිය<br>ඒ. විමලවීර මහතා (2017 ජූලි සිට) | කම්කරු කොමසාරිස් ජෙනරාල්<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>කොළඹ 05 |
| ඩී. එස්. විජේසේකර මහත්මිය<br>(2017 අගෝස්තු දක්වා) | අතිරේක ලේකම්<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>II වන අදියර, සෙත්සිරිපාය<br>බත්තරමුල්ල |
| ආර්.එම්.ඒ. රත්නායක මහතා | අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය<br>කොළඹ 01 |
| සිරිවර්ධන දහනායක මහතා | සාමාජික<br>අංක 3280, අදියර III<br>අනුරාධපුරය |
| එම්.ඩබ්ලිව්. ජයවර්ධන මහතා | සාමාජික<br>අංක 2795, ඩී. එස්. සේනානායක මාවත<br>අදියර III<br>අනුරාධපුරය |

# 2017 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ
# මූල මණ්ඩලය

| | |
|---|---|
| පියුමන්ති පීරිස් මහත්මිය<br><br><br><br>රෝෂිණී විලාසිතා මහත්මිය<br>(2017 අප්‍රේල් සිට) | අතිරේක ලේකම්<br>අධිකරණ අමාත්‍යාංශය<br>ඉහළ උසාවි සංකීර්ණය<br>කොළඹ 12<br><br>ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් |
| ආචාර්ය මධුරා එම්. වෙහැල්ල මහත්මිය | අතිරේක ලේකම්<br>අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය<br>බත්තරමුල්ල |
| එස්. සී. විතාන මහතා<br><br>ඩබ්ලිව්. ඒ. කුලසූරිය මහතා<br>(2017 මාර්තු සිට) | අතිරේක ලේකම්<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, බාලදක්ෂ මාවත,<br>කොළඹ 03 |
| ඒ. එම්. කේ. කේ. අත්තනායක මහත්මිය | අතිරේක ලේකම්<br>සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය<br>අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත<br>කොළඹ 10 |
| පී.ජේ.ඩී. ප්‍රනාන්දු මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය<br>සෙත්සිරිපාය<br>බත්තරමුල්ල |
| යූ. එස්. දෙනාවත්ත මහත්මිය<br><br><br><br>ඒ. එච්. එල්. ඩී. සොයිසා මහතා<br>(2017 නොවැම්බර් සිට) | අතිරේක ලේකම්<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය<br>අංක 330, යුනියන් පෙදෙස<br>කොළඹ 02<br><br>ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් |
| පී. මහදේව මහතා | කොමසාරිස්<br>කාන්තා හා ළමා කටයුතු අංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>කොළඹ 05 |
| හේමා පෙරේරා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය<br>අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ<br>කොළඹ 05 |

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 01 - 02 |
| ප්‍රධාන කාර්යභාරය | 02 - 03 |
| අධිකාරියේ ව්‍යුහය | 03 |
| 2017 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 04 |
| 2017 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය | 05 - 06 |
| **ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් - 2017** | |
| ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 06 |
| පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වා දීම | 07 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන මාර්ගෝපදේශ හා අවම ප්‍රමිතීන් සකස් කිරීම | 07 |
| දරුවන් සඳහා මානසික ප්‍රථමාධාර - හදිසි ආපදා තත්වයන් හි දී ළමා ආරක්‍ෂාව සම්බන්ධයෙන් ආදේශ කරගත හැකි ක්‍රියාකාරකම් ඇතුළත් මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම | 07 - 08 |
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශයක් සකස් කිරීම | 08 |
| සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාව (NVQ මට්ටම 04) | 08 |
| ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම | 08 - 09 |
| කතරගම පූජා භූමිය ආශ්‍රිතව සිදු කළ වීදි ළමුන් සම්බන්ධ නියමු ව්‍යාපෘතිය | 09 |
| වෙරළබඩ කලාපය තුළ ළමා ආරක්ෂාව සඳහා වන නියමු වැඩසටහන | 09 - 10 |
| ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම | 10 |
| ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රජාව සමග කටයුතු කරන නිලධාරීන් දැනුවත් කිරීම | 11 |
| ප්‍රාදේශීය වැඩසටහන් | 11 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම | 11 |
| සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය | 12 |
| පොලිස් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 12 |
| ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 - 13 |
| තේ වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීම | 13 |
| අන්තර්ජාල සුරක්ෂිතතාවය පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 13 |
| ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන | 14 |
| දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී භාවිතයට ගැනීම සඳහා වාර්තාමය වැඩසටහනක් නිර්මාණය කිරීම | 14 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නව තොරතුරු වෙබ් අඩවිය සකස් කිරීම | 14 |
| ළමා හිංසනයට එරෙහි ජාතික දිනය | 15 |
| ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය | 15 |
| ලෝක ළමා දිනය | 16 |
| ජාත්‍යන්තර ගැහැණු ළමයාගේ දිනය | 16 - 17 |
| ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම | 17 |
| තොරතුරු ලබාදීම | 18 |

| | |
|---|---|
| සුනාමි ව්‍යසන හේතු කොටගෙන වින්දිත වූ ළමුන් සඳහා සුබසාධන කටයුතු සිදු කිරීම | 18 |
| ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම | 18 |
| ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතනය (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීමේ වැඩසටහන | 18 |
| මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබාදීම | 19 |
| ශ්‍රී ලංකාවේ පාසල් තුළ ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය | 19 |
| අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | 19 |
| 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව | 19 - 20 |
| ළමා අපයෝජනය පිළිබඳ පැමිණිලි | 20 |
| නීතිමය කර්තව්‍යන් | 20 - 21 |
| විශේෂ පොලිස් විමර්ශන | 21 |
| 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය | 22 |
| 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 23 |
| 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 25 |
| 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 27 |
| විගණන වාර්තා | 28 |

# හැඳින්වීම

වර්තමානය වන විට ළමා අපයෝජනය සිදුවන ආකාරයන්ගේ වෙනස්වීමක් දක්නට ලැබේ. මෙහිදී ළමුන් කෲරත්වයට භාජනය වීමේ වැඩිවීමක් දක්නට ලැබේ. එමෙන්ම පරිගණක හා අන්තර්ජාල භාවිතය වැඩිවීමත් සමග ළමා අපයෝජනය සිදු කිරීමට එම මාධ්‍ය භාවිතා කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණ ද එම ළමා අපයෝජන වාර්තා නොවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය. මෙම කරුණු හඳුනාගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමුන් අපයෝජනයන්ගෙන් වලක්වා ගැනීමට කටයුතු කිරීම සිදු කරයි.

1989 නොවැම්බර් 20 වන දින "එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය" විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදි. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම අරමුණු කරගත්, ජාත්‍යන්තර රහස් වෙළඳාම ඉහළ යාම දැඩි ලෙස සැලකිලිමත් වෙමින් ද, ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර්ජාතික අපරාධයක් ලෙස දක්වමින් ද වර්ෂ 2000 දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදි.

ලොව පැවති මෙම ප්‍රවණතාවයත් සමග ලංකා රජය ද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සඳහා 1991 වසරේ දී අත්සන්කොට තම එකඟතාවය පළ කරන ලදි. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහිදී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරී බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට ම වර්තමානය දක්වා ම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ බලතල භාවිතා කරමින් දැයේ ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින්ද අධිකාරිය වෙත බලතල හිමි ව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තාවීමේ දී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් විය හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරී පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන වාර්තා වීම දක්නට ලැබුණි. අද වනවිට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තා වන අතර, උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් මෙම වසර තුළදීත් තම සංවර්ධන කාර්යයන් සිදු කර ඇත.

## ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්ය භාරයක් පැවරී ඇත.

- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපයෝජනවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවල දී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපයෝජන වලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමු වීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභ සිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලු කර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවල දී උචිත පියවර ගැනීම.
- ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.
- ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත්සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.


- ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.
- ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.
- ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කරගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කරගැනීම.

## අධිකාරියේ ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත ඒකක ක්‍රියාත්මක වේ.

- පරිපාලන හා මානව සම්පත් ඒකකය
- මූල්‍ය ඒකකය
- සැලසුම් හා නියාමන ඒකකය
- තොරතුරු හා මාධ්‍ය ඒකකය
    - පුස්තකාලය
- වැඩසටහන් ඒකකය
- මනෝසමාජීය ඒකකය
- නීති ඒකකය
- නීතිය බලාත්මක කිරීමේ ඒකකය
    - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
    - විමර්ශන ඒකකය
    - මධ්‍යම ලේඛනාගාරය
- අභ්‍යන්තර විගණන ඒකකය
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය

# 2017 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය



# 2017 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ
# අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | වැටුප් - කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජෙනරාල් | HM -2-1 | 01 | 01 |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් | HM -1-3 | 01 | - |
| 03 | අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | 01 |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | - |
| 05 | අධ්‍යක්ෂ - නීති | HM -1-1 | 01 | - |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | 01 |
| 07 | අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | HM -1-1 | 01 | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 |
| 11 | සහකාර අධ්‍යක්ෂ - නීති | MM -1-1 | 01 | 01 |
| 12 | සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් | MM -1-1 | 01 | 01 |
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා | MM -1-1 | 01 | 01 |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 |
| 15 | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු හා මාධ්‍ය | MM -1-1 | 01 | - |
| 16 | සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | 01 |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01 |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM - 1-1 | 01 | - |
| 20 | පරිපාලන නිලධාරී | JM - 1-1 | 01 | 01 |
| 21 | වැඩසටහන් නිලධාරී | JM - 1-1 | 01 | - |
| 22 | ගිණුම් නිලධාරී | JM - 1-1 | 01 | 01 |
| 23 | විමර්ශන නිලධාරී | JM - 1-1 | 01 | 01 |
| 24 | තොරතුරු හා මාධ්‍ය නිලධාරී | JM - 1-1 | 01 | 01 |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරී | JM - 1-1 | 01 | 01 |
| 26 | පර්යේෂණ හා සුභසාධන නිලධාරී | JM -1-1 | 01 | 01 |
| 27 | පරිවර්තක (ඉංග්‍රීසි) | MA - 4 | 01 | - |
| 28 | පරිවර්තක (දමිළ) | MA - 4 | 01 | - |
| 29 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී | MA - 3 | 25 | 24 |
| 30 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී | MA - 3 | 25 | 18 |
| 31 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී | MA - 3 | 360 | 237 |
| 32 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 33 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 03 |
| 34 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | 03 |
| 35 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | 01 |
| 36 | සැලසුම් සහකාර | MA - 3 | 01 | 01 |
| 37 | නීති සහකාර | MA - 3 | 03 | 01 |
| 38 | විමර්ශන සහකාර | MA - 3 | 02 | 02 |
| 39 | උපදේශන සහකාර | MA - 3 | 04 | 04 |
| 40 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 |
| 41 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 01 | 01 |
| 42 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 | 01 |
| 43 | චිකිත්සක | MA - 3 | 03 | 02 |
| 44 | වීඩියෝ තාක්ෂණ සහකාර | MA - 2-1 | 01 | - |
| 45 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA - 2-1 | 15 | 14 |
| 46 | තොරතුරු තාක්ෂණ සහකාර | MA - 2-1 | 02 | 02 |
| 47 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA - 1-1 | 32 | 30 |
| 48 | රියදුරු | PL-3 | 07 | 06 |
| 49 | පණිවිඩකරු | PL-1 | 01 | - |
| 50 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 02 |
| 51 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 |
| මුළු සංඛ්‍යාව | | | **527** | **374** |

2017 වසරේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සංවර්ධන ක්‍රියාකාරී සැලැසුම් 3 ක් යටතේ ක්‍රියාත්මක විය. ජාතික ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 50), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ශක්තිමත් කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 33) සහ ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම (රුපියල් මිලියන 23.480) වශයෙන් සඳහන් කළ හැකිය.

# ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2017

## ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රධාන කාර්යභාරයක් වේ. අධිකාරි පනතේ 14 (අ) වගන්තිය ප්‍රකාරව ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම. මේ වනවිට මෙම ප්‍රතිපත්තියේ කෙටුම්පත සකස්කර අවසන් කර ඇත. මේ සඳහා ක්ෂේත්‍රයේ විද්වත් වෘත්තිකයන්ගෙන්, ප්‍රවීණයන්ගෙන්, පාසල් ළමුන් ගෙන් සහ මහජනතාවගෙන් අදහස් ලබාගැනීම සිදුකර ඇත. මෙම අදහස් ලබාගැනීම සඳහා policy@childprotection.gov.lk වෙබ් පිටුවක් ද ආරම්භ කරන ලදි. එමෙන්ම දිණමිණ, තිනකරන් සහ ඩේලිනිවුස් යන පුවත්පත් මාර්ගයෙන් මහජන අදහස් ලබා ගැනීම ද සිදු කර ඇත. ළමා ආරක්ෂාව පිළිබඳ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සහ විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර එමගින් මෙම කෙටුම්පත අධ්‍යනය කර සංශෝධනයන් ද ඇතුළත් කර, ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත අවසන් කර ඇත.

## පාසල් විෂය මාලාව සඳහා ජීවන නිපුණතා හඳුන්වාදීම

මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිටම ජීවන නිපුණතා හඳුන්වාදීමට කටයුතු කරයි. 2017 වසරේ 2 වන සහ 3 වන ශ්‍රේණිය සඳහා මෙම ජීවන නිපුණතා හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ ළමයාගේ ශරීරය පිළිබඳ නිසි අවබෝධය හා එය ආරක්ෂා කර ගැනීම පිළිබඳ නිසි හැකියාව ඇති කිරීම තුළින් ළමුන් අපයෝජන වලින් ආරක්ෂා වීමට අවශ්‍ය පසුබිම ඇති කිරීමයි. එමෙන්ම තීරණ ගැනීම, ප්‍රශ්න විසඳීම, නිර්මාණාත්මක චින්තනය, විචාරාත්මක චින්තනය, අන්තර්පුද්ගල සබඳතා, ස්වයං අවබෝධය, සානුකම්පිත බව, හැඟීම් කළමනාකරණය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ආයතනික කළමනාකරණය යන විෂය ධාරාවන් ඔස්සේ ළමුන් ඉගෙනුම කෙරෙහි යොමු කිරීමට ද එමගින් අපේක්ෂිත ය. මීට අවශ්‍ය ගුරු පුහුණු පාඨමාලා සකස් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය සමග කටයුතු කරමින් සිටියි. මෙහිදී ගුරු උපදේශකවරුන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක වශයෙන් වීඩියෝ පට 03 ක් සකස්කරන ලදි. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළ පළාත් 05 ක 2 සහ 3 ශ්‍රේණිවලට අයත් ගුරු උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා වන වැඩසටහන් 6 ක් පවත්වා ඇති අතර, දැනුවත් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 345 දෙනෙකි. එමෙන්ම ජීවන කුසලතා සහ අවබෝධාත්මක ලිංගික අධ්‍යාපනය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන ඇත.

## ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන මාර්ගෝපදේශ හා අවම ප්‍රමිතීන් සංග්‍රහයක් සකස් කිරීම

ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමේදී ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජීවත්වන ළමුන්ගේ රැකවරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සිදු කළ යුතු වේ. ඒ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා රැකවරණ සේවා සපයන ආයතන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමට මූලික කටයුතු සිදු කර ඇත. මෙහි මූලික අරමුණ වන්නේ ජාතික මට්ටමෙන් සෑම ළමා නිවාසයකම (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) ගුණාත්මක බව හා ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම සහ ආරක්ෂිත මෙන්ම ළමා හිතකාමී ළමා නිවාස (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) සේවා ප්‍රවර්ධනය කිරීම. මෙහි කෙටුම්පතක් සකසා ඇති අතර, මෙය සකස් කිරීම සඳහා මූලික සාකච්ඡාවක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පළාත් පරිවාස කොමසාරිස්වරුන් සමග පවත්වා ඇත.

## දරුවන් සඳහා මානසික ප්‍රථමාධාර - හදිසි ආපදා තත්වයන් හි දී ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ආදේශ කරගත හැකි ක්‍රියාකාරකම් ඇතුළත් මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම

ජලගැලීම්, සුළිසුලං, නායයෑම්, භූමිකම්පා හා සුනාමි අවස්ථා හේතුවෙන් ඕනෑම වේලාවක දී ආපදා තත්ත්වයක් ඇති විය හැකියි. එවැනි ආපදා තත්ත්වයක දී ළමයින් දැඩි අපහසුතාවයන්ට ලක්වේ. එබැවින් ආපදා තත්ත්වයකදී ළමයින් රැකබලා ගැනීම විශේෂ අවධානයකින් සිදු කළ යුතුය. මෙහිදී කඳවුරු තුළදී ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කළ යුතුය. මෙවැනි අවස්ථාවලදී ළමයින්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබාදිය යුතුයි. එය සැලකිල්ලට ගනිමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අදාළ පාර්ශවකරුවන් සමග එක්ව මෙවැනි අවස්ථාවල දී කටයුතු කිරීම සඳහා මනෝසමාජීය ප්‍රථමාධාර ඇතුළත් අත් පොතක් සකස් කිරීම ආරම්භ කර ඇත. මෙහි අරමුණු වන්නේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම, මනෝසමාජීය ක්‍රියාකාරකම් උපයෝගී

කරගනිමින් පවුල හා ළමයා අතර සම්බන්ධතාවය ගොඩනැගීම සහ ප්‍රජාව බලගැන්වීම. මේ සඳහා ජාතික හා අන්තර්ජාතික වශයෙන් අදාළ තොරතුරු රැස්කර අවසන් කර ඇත.

මෙම වසරේ දී කොළඹ, ගම්පහ, ගාල්ල, මාතර, කළුතර, රත්නපුර, කෑගල්ල සහ හම්බන්තොට ඇති වූ නාය යෑම් හදිසි තත්ත්වය සහ කොළඹ අවට ඇතිවූ හදිසි ගංවතුර උවදුර හේතුවෙන් අවතැන් වූ ළමුන්ට සහ කඳවුරු වාසීන්ට සුභසාධන කටයුතු සිදු කරන ලදි. එමෙන්ම මීතොටමුල්ල කුණු කන්දෙන් වූ ආපදා තත්ත්වය වූ අවස්ථාවේ ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්, ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහ මනෝසමාජීය අංශයේ නිලධාරීන් මේ සඳහා සහභාගී විය.

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශයක් සකස් කිරීම

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ළමා ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මූලිකත්වය ගනිමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශය සකස් කිරීමට කටයුතු කරයි. මෙහි අරමුණු ලෙස ජාතික මට්ටමින් සෑම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයකම ගුණාත්මක බව හා ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම සහ වෘත්තීමය සහ ආරක්ෂිත ළමා දිවා සුරැ කුම් සේවා සංවර්ධනය කිරීම. දිවා සුරැකුම් මධ්‍යස්ථාන මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පත සකස් කර ඇත. එය රේඛීය අමාත්‍යාංශය වන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත භාරදෙන ලදී. 2017.07.25 වන දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලැබී ඇත. එමෙන්ම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අවසන් කර තිබේ. මෙහි පිටපත් 5000 ක් මුද්‍රණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.

## සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාව (NVQ මට්ටම 4)

2016 වසරේ දී රුපියල් මිලියන 50 මුදලක් ළමා රැකවරණ සපයන්නන්ගේ රාජකාරි ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට අදාළ ජාතික මාර්ගෝපදේශයට සමගාමීව සාමාන්‍ය ළමා සුරැකුම් සහතිකපත්‍ර පාඨමාලාව (NVQ 4) සකස් කර එය හඳුන්වා දීම සිදු කරන ලදී. ඒ අනුව වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) දිස්ත්‍රික් 5 ක් තුළ (කොළඹ, කළුතර, මහනුවර, ගාල්ල සහ කිලිනොච්චි) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි මෙම පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. මෙම පාඨමාලාව පැවැත්වීම සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත බඳවාගනු ලැබූ නව උපදේශකවරුන් සඳහා පුහුණු (TOT) පවත්වන ලදි. මෙම පාඨමාලාව මොඩියුල් 12 කින් සමන්විත වන අතර ඒ සඳහා පුහුණු අත්පොතක් ද සකසා ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම

ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් තුළ කටයුතු කිරීම අනිවාර්යෙන් ම සිදු කළ යුතුය. එහිදී දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම එක් කාර්යයක් වේ. එහිදී වැඩිහිටියන් විසින් ළමුන් සුරක්ෂිත කිරීමේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමත් ළමුන් තුළ තම ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනයට මග පෙන්වීමත් සිදු කළ යුතුවේ. මෙහිදී දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා

ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ ළමා ලේකම් කාර්යාල නිලධාරීන් විසින් සිදු කරයි. එම දැනුවත් කිරීමේ වැඩසටහන් එකම ප්‍රමිතියකින් සිදු කිරීම සඳහා මාර්ගෝපදේශයක් අවශ්‍ය බව තීරණය විය. මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පත සකස් කර අවසන් කර ඇත. ඒ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම ආරම්භ කර තිබේ. මෙහි අරමුණු වන්නේ ළමා ආරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් එකම ක්‍රමවේදයකට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ළමුන්ගේ සුරක්ෂිතතාවය කාර්යක්ෂමව ඉටුකිරීම උදෙසා පාර්ශ්වකරුවන් බලගැන්වීමයි. මෙම මාර්ගෝපදේශ කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශ මණ්ඩල සංදේශ 2 ක් සකස් කර ඇත. 2017 වසරේ වැඩසටහන් 05 ක් පවත්වා ඇත. දැනුවත් කර ඇති සංඛ්‍යාව 150කි.

## කතරගම පූජා භූමිය ආශ්‍රිතව සිදු කළ වීදි ළමුන් සම්බන්ධ නියමු ව්‍යාපෘතිය

කතරගම පූජා භූමිය ආශ්‍රිතව ජීවත්වන වීදී ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන සඳහා ගෝතමී ගම සහ නාගහ වීදිය ගම යොදා ගන්නා ලදි. මෙම ගම්වල ළමුන් සහ වැඩිහිටියන් ඉලක්ක කර ගනිමින් මෙය ක්‍රියාත්මක කෙරුණි. මෙමගින් සියලු ළමුන්ගේ සතුට, ආත්ම අභිමානය, ස්වාධීනත්වය සහ නිර්මාණශීලීත්වය යන සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට ළමා මිතුරු ග්‍රාමීය පරිසරයක් බිහි කිරීම සහ දෙමාපියන්ගේ යහපැවැත්ම දියුණු වී ළමුන්ගේ සංවර්ධනයට දායකවන ගම්වැසියන් පිරිසක් බිහි කිරීමයි. 2017 වසරේ වැඩසටහන් 13 ක් සිදුකර ඇත. වැඩිහිටියන් සහ ළමුන් 951 මේ සඳහා සහභාගි විය.

## වෙරළබඩ කලාපය තුළ ළමා ආරක්ෂාව සඳහා වන නියමු වැඩසටහන

වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂක නියමු ව්‍යාපෘතිය යටතේ 2017 දෙවන අදියර හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාරිගම වැල්ලබඩ ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක කර ඇත. මෙහි අරමුණු වන්නේ සාම්ප්‍රදායික දැනුවත් කිරීමේ ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට යමින් වඩාත් ඵලදායි ප්‍රජා දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ ළමුන් සඳහා සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා අවදි කණ්ඩායම් ග්‍රාමීය මට්ටමෙන් නිර්මාණය කිරීමයි. හික්කඩුව අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 19 ක, ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, විදුහල්පතිවරුන් සහ උපදේශන ගුරුවරුන් 116 දෙනෙක් සහභාගී කරගනිමින් දෙදින වැඩමුළුවක් පවත්වන ලදි. මෙහිදී දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, රාජ්‍ය නිලධාරීන් සහ පාසල් ළමුන් දැනුවත් කර ඇත. 2017 වසරේ වැඩසටහන් 12 ක් පවත්වා තිබේ. ළමයි 163 දෙනෙක් සහ රාජ්‍ය නිලධාරීන් 150 දෙනෙක් සහ සිවිල් ප්‍රජාව 89 දෙනෙක් සහභාගිවී ඇත. මෙම වැඩසටහන යටතේ අත් පත්‍රිකා 02 ක් මුද්‍රණය කර බෙදා හරින ලදි.









අත් පත්‍රිකා







## ළමා හිතකාමී පාසල් පරිසර නිර්මාණය කිරීම

පාසල් ළමා ආරක්ෂක කමිටු ක්‍රියාකාරිත්වය තුළින් ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂාවයි. පාසල් ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම, අවබෝධය හා කුසලතාවයන් පාසල් ප්‍රජාව තුළ මෙන්ම ළමුන් තුළද වර්ධනය කිරීම හා ඒ සඳහා ඔවුන් ශක්තිමත් කිරීම උදෙසා පාසල් මට්ටමේ යාන්ත්‍රණයක් ඇති කිරීම තුළින් ළමුන්ගේ යහ පැවැත්ම සංවර්ධනය වන පරිසරයක් පාසල් තුළ ඇති කිරීමත්, ඒ සඳහා ක්‍රියාකාරී පාසල් ප්‍රජාවක් නිර්මාණය කිරීමත් මෙම වැඩසටහනේ මූලික අරමුණවේ. මෙහිදී අංශ කිහිපයක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. පර්ෂද වැඩසටහන ලෙස ළමා මිතුරු පාසල් සාමාජිකයින් සහ අනිකුත් අදාළ පුද්ගලයන්ගේ කුසලතා සංවර්ධනය පිළිබඳ පසු විපරම සිදු කරයි. පාසල් ළමා ආරක්ෂක කමිටු දැනුවත් කිරීම සහ පිහිටුවීම යටතේ 2017 වසරේ වැඩසටහන් 987 මගින් දැනුවත් වූ ප්‍රතිලාභීන් ගණන 26,305 කි.

## ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රජාව සමග කටයුතු කරන නිලධාරීන් දැනුවත් කිරීම

ළමා අපයෝජන වැළැක්වීම අරමුණු කරගෙන මෙම වැඩසටහනේ දී ප්‍රධාන වශයෙන් ළමුන්ගේ සුරක්ෂිත බවට ප්‍රබල බලපෑමක් එල්ල කරන පරිසර සාධක වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. ඒ අනුව දෙමව්පියන් විදේශගත වීම, ආර්ථික විෂමතා හා දිළිඳුකම, විද්‍යුත් මාධ්‍ය භාවිතය, අනවබෝධය හා ආකල්ප, දෙමාපිය ආරවුල් හා ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය, මධ්‍යසාර හා දුම්වැටි භාවිතය, පවුලේ අසතුට හා අසමගිය, අවශ්‍යතා හා අනවශ්‍යතා, නිවාස පරිසරය සහ සංස්කෘතිය යනාදී සාධක සමග කටයුතු කළ යුත්තේ කෙසේද යන්න සාකච්ඡාවට භාජනය කෙරේ.

නිතර සිදු කරන දැනුවත් කිරීමේ ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් ප්‍රජා සංවර්ධනය උදෙසා කටයුතු කරන නිලධාරීන් හා රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්ගේ ධාරිතාවයන් වර්ධනය තුළින් ප්‍රජාව දැනුවත් කෙරේ. 2017 වර්ෂයේ මෙම වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 239 ක් වෙත මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලදි. වැඩසටහන් 224 ක් සිදුකර ඇත. දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 9,868 දෙනෙකි.

## ප්‍රාදේශීය වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තොරතුරු හා සාක්ෂි මත පදනම්ව එක් ගමක් තෝරාගෙන එම ගම තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු කරයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වන්නේ එක් ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයක එක් ගමක් තෝරාගෙන එම ගම ළමුන්ට වඩාත් සුදුසු ස්ථානයක් කිරීම සඳහා ගමේ ප්‍රජාව බලගැන්වීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කිරීමයි. මේ සඳහා යෝජනාවලියක් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබාගැනීම සිදු කරයි. යෝජනා 231 ක් ලැබී ඇත. මෙම යොජනාවලින් අදාළ සංශෝධනවලට අදාළව අනුමත කිරීම් සිදු කිරීමෙන් අනතුරුව අදාළ දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදා හරින ලද අතර එම ප්‍රදේශයට අදාළව තෝරාගත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සිදුවිය. මෙහිදී අදාළ නිලධාරීන් විසින් ඔවුන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මේ අතර ළමා ක්‍රියාකාරකම් මධ්‍යස්ථාන ඉදිකිරීම, ළමා පුස්තකාල ආරම්භ කිරීම, ළමා පුස්තකාල සඳහා අළුත් පොත් මිලට ගෙන පුස්තකාල නවීකරණය, ළමුන් සඳහා නිර්මාණාත්මක වැඩසටහන් පැවැත්වීම ආදී විවිධ වැඩසටහන් රාශියක් පවත්වන ලදි. 2017 වසර තුළ දී වැඩසටහන් 212 ක් පවත්වා ඇත.

## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීම උදෙසා පවත්වනු ලබන මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වනුයේ ගුරු වෘත්තියට ප්‍රවේශවීමට අපේක්ෂාවෙන් සිටින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන් හි ඉගෙනුම ලබන ගුරු සිසුන් වෙත ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම හා කුසලතා ලබාදීම තුළින් ළමුන් පිළිබඳ වඩාත් සංවේදී හා සවිඥානික ගුරු පරපුරක් බිහි කිරීමයි. ඒ අනුව, 2017 වර්ෂය තුළ දී ඌව, පස්දුන් රට, පේරාදෙණිය, සාරිපුත්ත, සියනෑ, රුහුණ, රුවන්පුර, මහරගම සහ වව්නියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන් හි පළමු, දෙවන සහ තෙවන වසර ගුරු සිසුන් 2,547 දෙනෙකු උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක කර ඇත.

## සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය

සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කුසලතා සංවර්ධනය උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. සෞඛ්‍ය වෘත්තිකයන් ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් හි දැනුමින් හා කුසලතා වලින් සන්නද්ධ කරලීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම, රාජ්‍ය නිලධාරියෙකු ලෙස ළමා අපයෝජනයක දී හෝ එවැනි අවදානම් තත්ත්වයක දී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම, කුසලතා හා ආකල්ප ලබාදීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2017 වර්ෂයේ දී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, හෙද නිලධාරීන්, ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයන් 1,220 දෙනෙකු උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 19 ක් පවත්වා ඇත.

## පොලිස් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

ළමා අපයෝජනයක් සිදුවීමේ සිට වින්දිත ළමයාගේ මුල් ප්‍රකාශ සටහන් කරගැනීමේ සිට ඇරඹෙන සමස්ත යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළදී ම ළමා හිතකාමී සහ වින්දිත ළමයාගේ අනන්‍යතාවය සුරකෙන ක්‍රමවේදයක් භාවිතා කිරීම සහ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට මෙමගින් කටයුතු කරන ලදි. පොලිස්පතිතුමාගේ අධීක්ෂණය යටතේ නිර්දේශ කරන ලද දිවයිනේ ළමා හා කාන්තා කාර්යාංශ සියල්ල නියෝජනය වන පරිදි නිලධාරීන් 85 දෙනෙකු සඳහා දින 05 ක නේවාසික පුහුණුවක් රාගම ළමා පියස පරිශ්‍රයේ දී පවත්වා ඇත. මෙම නේවාසික පුහුණුව සඳහා මහා බ්‍රිතාන්‍ය රජයේ Sussex පොලිසියේ නිලධාරීන් දෙදෙනෙක්ගේ සම්පත් දායකත්වය ලබාදෙන ලදි. එමෙන්ම වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සහ ඊට අදාළ නීතිය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 3 ක් පවත්වා ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පොලිස් ළමා හා කාන්තා කාර්යංශ නිලධාරීන් 72 දෙනෙකු සඳහා ද, කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පිළිවෙලින් නිලධාරීන් 160 ක් සහ 70 ක් සඳහා ද මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.





## ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්

ළමා ආරක්ෂාව වෙනුවෙන් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් සිදුකර ඇත. එහි දී පාසල් ළමුන්, විවිධ වෘත්තිකයන්, ගුරුවරුන් සහ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත නිලධාරීන් සඳහා දැනුවත් කිරීම සිදුකර ඇත. 2017 වසරේ ළමුන් 100, ගුරුවරුන් 59, වෘත්තිකයන් 1280, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත නිලධාරීන් 530, බංග්ලාදේශ හෙද නිලධාරීන් 19, ළමුන් හා දෙමාපියන් 135 සහ අධ්‍යාපන පරිපාලන නිලධාරීන් 191 දෙනෙකු දැනුවත් කර ඇත.

## තේ වතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීම

තේ වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් ළමා සුරක්ෂිත පවුල් බවට පත් කරමින් ඒවායේ ජීවත්වන ළමුන් සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හි නිරතවන නිලධාරීන් පිරිසක් තේ වතු ආශ්‍රිතව බිහිකරලීම අරමුණු කර ගනිමින් තේවතු ආශ්‍රිතව ජීවත්වන ළමුන්ගේ රැකවරණය තහවුරු කිරීම උදෙසා නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන් හි තේ වතු 23 ක් ආශ්‍රිතව 2017 වර්ෂයේ දී වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී. ඒ අනුව, 2017 වර්ෂය තුළ දී තේ වතු ආශ්‍රිතව ජීවත් වන ළමුන්, දෙමාපියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්, වතු නායකයින් හා ප්‍රජා සාමාජිකයින් 2,875 දෙනෙකු උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් 76 ක් පවත්වා ඇත.

## අන්තර්ජාල සුරක්ෂිතතාවය පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

අන්තර්ජාලය ඔස්සේ ළමයින් අපයෝජනයට ලක් වීම, වැළැක් වීම සඳහා ප්‍රජාව සමග සම්බන්ධ වන නිලධාරීන් පුහුණු කිරීම මෙහිදී සිදු කරනු ලබයි. එහිදී අන්තර්ජාල අවභාවිතය සහ හිංසනය පිළිබඳ අවධානම් සාධක පිරික්සීමකට ලක්කරන අතර, එකී අවධානම් සාධක ආරක්ෂිත සාධක බවට පත් කරලීමට අවශ්‍ය කුසලතාවය වැඩිදියුණු කරනු ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ පවතින අන්තර්ජාල ළමා අපරාධවලට අදාළ නීති රාමුව සම්බන්ධයෙන් ද දැනුවත් කෙරේ. අන්තර්ජාල ආරක්ෂණය සම්බන්ධයෙන් තාක්ෂණික ක්‍රමවේද සම්බන්ධයෙන් ද පුහුණුව දෙන අතර, අන්තර්ජාලය අවභාවිතා කරමින් හිංසනයට පත්වූ ළමුන් සඳහා මනෝසමාජීය මැදිහත්කරණය පිළිබඳ කුසලතාවය මෙමගින් ආවරණය කරයි. දැනුවත් කිරීමේ අත් පත්‍රිකා, දේශන, සටහන්, වීඩියෝ සහ සිද්ධි අධ්‍යයනයන් භාවිතයට ගනු ලබන අතර, 2017 වර්ෂයේ කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, රත්නපුර, කෑගල්ල, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් තුළ වැඩසටහන් 08 ක් පවත්වා නිලධාරීන් 460 දෙනෙකු දැනුවත් කර ඇත.

## ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන

අපයෝජනවලින් ළමයින් ආරක්ෂා කරගැනීමට අදාළ තොරතුරු පාසල් මාධ්‍ය ඒකක හරහා පාසල තුළ ප්‍රචලිත කිරීම මෙහි මූලික අරමුණ වේ. සිසු සිසුවියන්ට අදාළ විෂය පිළිබඳව පුහුණුවක් ලබාදීම ද සිදුකරයි. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සහයෝගය ඇතුව සකසා ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව සංවිධානය කරන පාසල් මාධ්‍ය සමාජ බලගැන්වීම තුළින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන සඳහා වන මොඩියුලය සම්බන්ධ විශේෂ වැඩසටහනක් 2017.08.28 වන දින අධිකාරියේ දී පවත්වන ලදි. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පාසල් මාධ්‍ය ඒකක සමග කටයුතු කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කළ අතර, මෙම වැඩසටහන වඩාත් සාර්ථකව ඉදිරියේ දී සිදු කිරීමට අදාළ මොඩියුලයේ කෙටුම්පත යාවත්කාලීන කිරීම ද සිදුකරන ලදි. 2017 වර්ෂයේ වැඩසටහන් 05 ක් පවත්වා ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 500 කි.





## දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී භාවිතයට ගැනීම සඳහා වාර්තාමය වැඩසටහනක් නිර්මාණය කිරීම

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමේ දී එම පණිවිඩය වඩාත් ප්‍රබල ලෙස යොමු කිරීම සඳහා වාර්තා වැඩසටහන් භාවිතා කිරීම යෝග්‍ය වේ. ඒ වෙනුවෙන් සකස් කිරීමට නියමිත වාර්තා වැඩසටහන සකස් කිරීම සඳහා Triad (pvt) & Ltd ආයතනය වෙත ලබා දී ඇත. කාටූන් චිත්‍රපටියක් ලෙසින් මෙම වාර්තා වැඩසටහන නිෂ්පාදනය කෙරේ. මෙම වාර්තා වැඩසටහන ළමයින් සඳහා නිර්මාණය වන අතර තේමාව වන්නේ "නිවැරදි දේ කිරීම සඳහා ආත්ම ශක්තිය ඇතිකර ගනිමු" යන්නයි.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය  සංවර්ධනය කිරීම සහ නව තොරතුරු වෙබ් අඩවිය සකස් කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියට අමතරව ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් නව වෙබ් අඩවියක් සකස් කර ඇත. එය www.youthink.lk 2017.03.28 වන දින එළි දක්වන ලදි. ළමා අපයෝජනවලින් ළමුන් ආරක්ෂා කරගනිමින් ඔවුන්ට සුරක්ෂිත වටපිටාවක් උරුමකර දීමට අදාළ තොරතුරු එම නව වෙබ් අඩවියට ළමා හිතකාමී ලෙස ඇතුළත් කර ඇත. අධිකාරියේ තොරතුරු වෙබ් අඩවියත් ත්‍රෛයි භාෂාවන්වලට පරිවර්තනය කර ඇති අතර, අධිකාරියේ නිල වෙබ් අඩවිය ද මේ වන විට ICT ආයතනය ත්‍රෛයි භාෂාවන්වලට පරිවර්තනය කර ඇත.

## ළමා හිංසනයට එරෙහි ජාතික දිනය

ශ්‍රී ලංකාව විසින් සෑම වසරකම ජනවාරි 04 දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස ප්‍රකාශයට පත්කරන ලදි. 2017 වර්ෂයේ දී ළමා හිංසනයට එරෙහි ජාතික දිනය වෙනුවෙන් ජනමාධ්‍ය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන්, වෙබ් අඩවි සහ සමාජ ජාල හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදි.


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය

"ගැටුම් හා ආපදාවන් හි ප්‍රතිඵලයක් ලෙස ළමයින් ශ්‍රමිකයන් වීම වැළැක්වීම" යන තේමාව මුල්කර ගනිමින් මෙවර ද ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය සමරන ලදි. මෙම ජාතික දිනය සැමරීම සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාදිවෙල රාහුල විද්‍යාලයේ දී පැවැත් වූ අතර, එහි දී විශේෂත්වය වූයේ "බිංදු කුරුල්ලා රාණිට යාළුවෙක්"යන වීදි නාට්‍ය රඟදක්වමින් ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන ආකාරය පැහැදිලි කිරීමයි.

මෙදිනට සමගාමීව සමස්ත ලංකා මට්ටමින් පෝස්ටර් තරඟයක් පවත්වන ලදි. ඒ සඳහා වයස අවුරුදු 14 - 18 අතර වූ පාසල් සිසු සිසුවියන් ඇතුළත් විය. පෝස්ටර් තරඟාවලිය සඳහා සහභාගී වූ සියළු පාසල් සිසු සිසුවියන් සඳහා සහභාගීත්ව සහතික පත්‍රයක් ලබාදීම සිදු කෙරුණි. සහතික පත්‍ර 430 ක් මුද්‍රණය කරන ලදි.

මෙම දිනට සමගාමීව පාසල් ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත කර ඇති පාසල්වල පාසල් ළමුන් හා ගුරුවරුන් උදෙසා දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 33 ක් පවත්වා ඇති අතර, එමගින් දැනුවත් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5,203 කි.





## ලෝක ළමා දිනය

"මාපිය වැඩිහිටි සෙනෙහස රඳවමු, සොඳුරු ලොවක් වෙත දරුවන් කැඳවමු" තේමාව මුල්කර ගනිමින් මෙවර ද ලෝක ළමා දිනය සැමරීම සිදුකරන ලදි. මෙහි ජාතික උත්සවය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදුකර ඇත. මෙම දින සැමරුමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සමරු කලාපයක් සකස් කිරීම සිදුකරන ලදි.

මීට අමතරව නල්ලදරන්කට්ටුව ජීවන ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලෝක ළමා දින සැමරුම් උත්සවය වෙනුවෙන් විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් හලාවත, නල්ලදරන්කට්ටුව කල්වාරි දේවස්ථානයේ දී ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ සහය ඇතිව පැවැත්වීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරන ලදි. මේ සඳහා 300ට අධික පාසල් සිසු සිසුවියන්, ගුරුවරුන් හා වැඩිහිටියන් පිරිසක් සහභාගී වන ලදි.





## ජාත්‍යන්තර ගැහැණු ළමයාගේ දිනය

"දියණියේ සුරක්ෂිත ලොවක පරිපූර්ණ වීමට අප ඔබට අත දෙමු" යන තේමාව මුල්කර ගනිමින් මෙවර ද ජාත්‍යන්තර ගැහැණු ළමයාගේ දිනය සැමරීම සිදුකරන ලදි. ජාතික වැඩසටහන බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණි. මෙම දිනයට සමගාමීව පාසල් ළමුන් 1000 කගේ සහභාගීත්වයෙන් පාගමනක් පැවැත් විය. මෙම වැඩසටහන ජාතික රූපවාහිණියේ සජීවීව විකාශනය කරන ලදි.

ජාතික වැඩසටහනට අමතරව ප්‍රාදේශීය මට්ටමෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි එකම දිස්ත්‍රික්කයකින් දුෂ්කර මෙන්ම අඩුපාඩු සහිත පාසල් එක බැගින් තෝරා ගෙන එම පාසල් 25 හේම ළමුන්, දෙමාපියන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා ගැහැණු ළමයා සවිබල ගැන්වීම තේමා කරගනිමින් අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය අංශය විසින් සකස් කරන ලද විශේෂ වීදිනාට්‍ය පෙන්වීම සිදු කරන ලදී.








## ප්‍රදර්ශන හා ජංගම සේවා පැවැත්වීම

විවිධ ආයතන මගින් අධ්‍යාපනික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබන අතර, ලැබෙන ඉල්ලීම් මත එම ප්‍රදර්ශන සඳහා ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන, ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම සිදු කරයි. මෙම වසරේ ජංගම ප්‍රදර්ශනවලට නව අංගයක් ලෙස 1929, ශ්‍රී ලංකා ළමා දුරකථනය ප්‍රවර්ධනය කිරීම සඳහා "බිංදු කුරුල්ලා රාණිට යාළුවෙක්" වීදි නාට්‍ය ද එකතු කරන ලදි. මෙහි විශේෂත්වය වන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ නිර්මාණශීලී හැකියාව උපයෝගී කරගනිමින් වඩාත් ප්‍රබල ලෙස ළමා ආරක්ෂක පණිවිඩ ප්‍රජාව වෙත සමීප කිරීමට හැකි වීමයි. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනනේ ප්‍රථම ජාතික උත්සවය 2017.09.08 දින පවත්වන ලදි. එම වැඩසටහන සඳහා ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ ජංගම ප්‍රදර්ශන කුටියක් ඇතුළත් කිරීම ද සිදු කරන ලදි. 2017 වර්ෂයේ වැඩසටහන් 09 ක් පවත්වා ඇත. ප්‍රතිලාභීන් 29,100 කි.






## තොරතුරු ලබාදීම

ළමා ආරක්ෂාව, ළමා අපයෝජනය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබා දීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. එහි දී අවශ්‍යතාවය පරිදි පෝස්ටර්, අත් පත්‍රිකා, පොත්, ස්ටිකර්, මුද්‍රිත ප්‍රකාශන සහ රූපමය වාර්තා වැඩසටහන් ලබාදීම සිදුකරයි. 2017 වසරේ බෙදා දී ඇති ප්‍රකාශන සංඛ්‍යාව සිංහල සහ දමිළ 326,245 කි.

## සුනාමි ව්‍යසනය හේතු කොටගෙන වින්දිත වූ ළමුන් සඳහා සුබසාධන කටයුතු සිදු කිරීම

සුනාමි විපතෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 21 ට අඩු සෑම ළමයෙකු ම හා යෞවනයෙකු සම්බන්ධව සුබසාධනය පිළිබඳව මෙහිදී සළකා බලයි. දෙමාපියන් දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැකගැනීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකු ම හා යෞවනයෙකුට ම 2005 අංක 16 දරන සුනාමි විශේෂ විධිවිධාන පනත මගින් රැකවරණය සලසයි. මේ යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වින්දිත වූ ළමුන් උදෙසා කැපකරු මාපිය රැකවරණ කටයුතු, පසු විපරම් කටයුතු හා සුභසාධන කටයුතු සිදු කරයි. 2017 වසරේ වැඩසටහන් 07 ක් පවත්වා ඇත. ප්‍රතිලාභී ළමුන් සංඛ්‍යාව 95 කි.

## ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ. 1999 අංක 32 දරන සාක්ෂි (විශේෂ විධි විධාන) පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගත කර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම මෙමගින් සිදු කළ හැකිය.

2017 වසරේ විඩියෝ සාක්ෂි පටිගත කිරීම් 145 ක ප්‍රමාණයක් නිමකොට ඇත. එමෙන්ම ඉල්ලීම් ලද අධිකරණ සඳහා පටිගත කළ සාක්ෂි පිටපත් 67 ක් මුදා හැර ඇත.

## ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීමේ වැඩසටහන

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ (14) ග වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පවරා ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා නිවාසයන් හි ජීවත් වන ළමුන්ගේ උපරිම යහපත සලසනු වස් 2017 වර්ෂය සඳහා වන ළමා නිවාස අධීක්ෂණය දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදි. මෙහි අරමුණු ලෙස ළමා රැකවරණ සේවා සපයන පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) අධීක්ෂණය කිරීම හා අදාළ විසඳුම් සෙවීමට සම්බන්ධ සියලු ආයතන හා එක්ව ඒකාබද්ධ අධීක්ෂණ ප්‍රවේශයක් යටතේ වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස සිදුකිරීම, ආයතනගත ළමුන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව තහවුරු වන වඩාත් සුරක්ෂිත ආයතනික පරිසරයක් ඇති කිරීම හා සේවයේ යෙදෙන පාර්ශ්වයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම යනාදිය වේ. 2017 වසරේ අධීක්ෂණ කටයුතු සිදු කිරීමට සමගාමීව දිස්ත්‍රික් ලේකම්වරුන්, පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්තුමිය සහ පළාත් කොමසාරිස්වරුන් ද දැනුවත් කරන ලදි. ඒ අනුව මෙම වැඩසටහන යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 350 ක් අධීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

## මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබාදීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශය වෙත සේවය ලබාගැනීම සඳහා පැමිණෙන ළමුන් සඳහා සහ මනෝ සමාජීය සහයන් අපේක්ෂා කරන ළමුන් සඳහා අවශ්‍ය සපහසුකම් සැපයීම. 2017 වසරේ දී ගාල්ල ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ළමුන් 80 දෙනෙක් වෙත මනෝ සමාජීය සහයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබාදීම සිදුකර ඇත. 2017 ඇති වූ ගංවතුර හා නායයෑම සිදු වූ බුලත් සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවතැන් වූ ළමුන්ට මනෝසමාජීය සහය ලබාදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදිම. එමෙන් ම මනෝසමාජීය ඒකකයට සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන ළමුන් 95 දෙනෙකුට ලිපිද්‍රව්‍ය ලබාදීම සිදුකර ඇත. එමෙන් ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණි ළමුන් සඳහා ද මේ යටතේ පාසල් උපකරණ කට්ටල ලබා දී ඇත. ළමුන් සඳහා උපදේශනය ලබාදීම, වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන් සූදානම් කිරීම සහ මනෝ සමාජීය මැදිහත්කරණය ලබාදීම.

## ශ්‍රී ලංකාවේ පාසල් තුළ ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ පාසල් තුළ භාවිතා වන ළමුන් හික්මවා ගැනීමේ ක්‍රම පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය සිදුකර අවසන් කරන ලදි. මෙම පර්යේෂණය පදනම්කර ගනිමින් "සතුටු පාසල" නියාමන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, එම නියමු ව්‍යාපෘතිය කොළඹ, නුවරඑළිය සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් හි තෝරාගත් පාසල් 06 ක් තුළ ක්‍රියාත්මක කරන ලදි. අදාළ පාසල් 06 තුළ ශාරීරික දණ්ඩනයට විකල්ප වශයෙන් පවතින ක්‍රියාමාර්ග පිළිබඳව ගුරුවරුන්, දෙමාපියන් හා සිසු දරුවන් දැනුවත් කිරීම හා පුහුණු කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2017 වර්ෂයේ වැඩසටහන් 7 ක් සිදුකර ඇත. නිලධාරීන් 50 දෙනෙකු, ළමුන් 380 දෙනෙක්, ගුරුවරුන් 25 දෙනෙකු සහ දෙමාපියන් 20 දෙනෙකු දැනුවත් කර ඇත.

## අඩු වයස් විවාහ වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ සම්බන්ධයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට 2017 වර්ෂයේ දී ආරම්භ කෙරුණි. මෙය දිස්ත්‍රික් මට්ටමෙන් සිදු කරන ලදි. මෙහි අරමුණු වූයේ තොරතුරු සාක්ෂි මත පදනම්ව දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගන්නා ලද එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයකට අදාළව අඩු වයස් විවාහ අවම වීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්ත විධිමත් වැඩසටහනක් ස්ථාපිත කිරීම හා එහි ප්‍රතිලාභ අදාළ පාර්ශව වෙත ලැබීමට කටයුතු සංවිධානය කිරීමයි. මේ සඳහා දිස්ත්‍රික් 25 න් යෝජනා කැඳවීමට කටයුතු කළ අතර යෝජනාවලීන් 17 ක් ලැබුණි. එම දිස්ත්‍රික්ක 17 වෙත රුපියල් 50,000.00 බැගින් මුදල් ප්‍රතිපාදන ලබා දී සාර්ථකව වැඩසටහන් 17 ක් සිදු කරන ලදි.

## 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව

ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව "ළමා අපයෝජනය පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම" යන්න වඩාත් ඵලදායී සහ කාර්යක්ෂමව කිරීම සඳහා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදි. මෙය ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම හා ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණය ද වේ. එමගින් සමාජය තුළ සැඟව තිබූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාවීමේ වර්ධනයක් ද දක්නට ලැබේ.

ගාස්තු අය කිරීමකින් තොරව ක්‍රියාත්මක වන සේවාව ඇමතීම මගින්, ඕනෑම පුද්ගලයෙකුට ළමයින් සම්බන්ධයෙන් පැන නගින ගැටළු මෙන්ම ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි සිදු කිරීමට හැකියාව පවතියි. මෙමගින් උපදේශන සේවය ලබාගැනීමට ද අවස්ථාව ලැබේ. මෙම සේවාව මූලිකව ළමුන් සඳහා වෙන්ව ඇතත් ගුරුවරුන්, දෙමව්පියන් සහ ළමා රැකවරණ සපයන්නන් බඳු

වැඩිහිටියන්ට ද, ළමුන් පිළිබඳ ඔවුන්ට ඇති ගැටළු ළමුන් හදා වඩා ගැනීමේ පරිචයන් ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාත් භාවිතා කළ හැකිය. 2017 වර්ෂයේ 1929 දුරකථන අංකයට ලැබී ඇති දුරකථන ඇමතුම් ප්‍රමාණය 131,413 කි. එයින් ළමා අපයෝජන පැමිණිලි ප්‍රමාණය 8,320 කි.

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය හරහා පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙන අතර, අධිකාරියට පැමිණ වාචිකව පැමිණිලි ඉදිරිපත් කිරීම මගින් ද, ලිපි මගින් ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිලි සිදුකරනු ලබයි. මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කිරීමකට ලක්වේ. 2017 වර්ෂයේ ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 9,014 කි.

## නීතිමය කර්තව්‍යන්

අපයෝජනයට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, ළමා අපයෝජන පිටු දැකීම සඳහා වූ නීතිමය පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීති උපදෙස් ලබාදීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළව අධිකරණයෙහි පෙනී සිටීම යනාදී කාර්යයන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි. අධිකාරි පනතට අමතරව පහත පනත්වලට අදාළව ද කටයුතු කරයි.

- 2005 අංක 16 දරන සුනාමි විශේෂ විධිවිධාන පනත
- 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාත්මක නීති අංශය මගින් 2017 වර්ෂයේ දී නීති උපදෙස් ලබාදීම් යටතේ දුරකථන මාර්ගයෙන් 436 ක් සහ සේවාලාභීන් 107 දෙනෙක් අධිකාරියට පැමිණ නීති උපදෙස් ලබාගන්නා ලදි. එමෙන්ම අධිකරණයේ නඩු සඳහා පෙනී සිටීම් 90 ක් සඳහා සහභාගි වී ඇත. රැස්වීම් 80 කට සහභාගි වී ඇත.

## 2017 වසර තුළ දී 2005 අංක 16 දරන සුනාමි (විශේෂ) විධිවිධාන පනත අනුව නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව (ළමා අපයෝජන සිද්ධි සඳහා)

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල ළමා අධිකරණය | 06 |
| මාතර මහේස්ත්‍රාත් අධිකරණය | 19 |
| ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 05 |
| හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණය | 29 |
| කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණය | 24 |
| කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 10 |
| වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 02 |
| බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මුළු සංඛ්‍යාව | **99** |

## 2017 වසර තුළ නීති අංශය දායක වූ නඩු සංඛ්‍යාව (ළමා අපයෝජන සිද්ධි සඳහා)

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| බත්තරමුල්ල ළමා අධිකරණය | 08 |
| ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 06 |
| කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය | 03 |
| කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| මුළු සංඛ්‍යාව | **22** |

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මගින් මහජනතාවගෙන් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් සිටී. ඒ සඳහා 24 පැය පුරාවටම ක්‍රියාත්මක වන, නිලධාරීන් 34 ක ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් යොදවා ඇත. 2017 වර්ෂයේ දී මෙම ඒකකයට පැමිණිලි 60 ක් ලැබී ඇත.

## 2017 වර්ෂයේ දී විශේෂ පොලිස් විමර්ශන ඒකකයට සෘජුව ලැබුණු පැමිණිලි

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | විමර්ශනයේ වර්තමාන තත්ත්වය (මූලික පොලිස් විමර්ශන) | අධිකරණයේ විභාග වන ගණන | අධිකරණයේ විභාග අවසන් ගණන |
|---|---|---|---|---|
| සුළු අපරාධ | 32 | 32 | 32 | 06 |
| විවිධ පැමිණිලි | 46 | 46 | 15 | - |
| බාල අපරාධ | 31 | 31 | 31 | - |
| මුළු සංඛ්‍යාව | **109** | **109** | **78** | **06** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් ප්‍රකාශය

(රුපියල්)

| විස්තරය | සටහන් | 2017 | 2016 ගලපන ලද ගිණුම් | 2016 |
|---|---|---|---|---|
| ආදායම | | | | |
| පුනරාවර්තන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය | | 230,972,593.19 | 240,703,967.00 | 240,703,967.00 |
| - අනෙකුත් ආයතන | 1A | 1,197,600.01 | 1,094,000.00 | 1,094,000.00 |
| අනෙකුත් ආදායම් | 1B | 23,966,627.04 | 87,788,549.23 | 271,179.72 |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 39,362,693.04 | 153,946,188.77 | 155,812,159.96 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1C | 448,800.00 | 214,000.00 | 214,000.00 |
| **මුළු ආදායම** | | **295,948,313.28** | **483,746,705.00** | **398,095,306.68** |
| **වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 2 | 214,624,146.43 | 209,200,244.78 | 208,768,284.47 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 98,018,188.89 | 145,207,921.12 | 156,606,259.76 |
| ව්‍යාපෘති වියදම් | 4 | 1,197,600.01 | 2,564,750.18 | 2,564,263.33 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | 594,300.00 | 414,848.10 | 424,848.10 |
| මූල්‍ය වියදම් | 6 | 12,750.72 | 30,340.29 | 30,340.29 |
| **මුළු වියදම්** | | **314,446,986.05** | **357,418,104.47** | **368,393,995.95** |
| **ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)** | **7** | **(18,498,672.77)** | **126,328,600.53** | **29,701,310.73** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2017.12.31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(රුපියල්)

| විස්තරය | සටහන් | 2017 | 2016 ගලපන ලද ගිණුම් | 2016 |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 103,384,535.03 | 102,278,961.31 | 103,863,315.64 |
| කල්බදු ඉඩම් | | 22,486,947.61 | 23,265,988.71 | 23,265,988.71 |
| ආයෝජන හා ඉතිරි කිරීම් | 9 | 8,040,348.65 | 8,280,842.30 | 9,734,766.20 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 1,020,779.99 | 100,226.70 | 100,226.70 |
| | | **134,932,611.28** | **133,926,019.02** | **136,964,297.25** |
| ජංගම වත්කම් | | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 459,919.81 | 439,315.09 | 439,315.09 |
| ආපදා ණය | | 470,734.14 | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 24,135,268.31 | 38,303,823.98 | 44,339,323.96 |
| පෙර ගෙවීම් | 12 | 607,562.00 | 2,585,313.31 | 2,588,313.31 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 4,256,729.99 | 40,236,116.03 | 42,046,055.76 |
| | | **29,930,214.25** | **82,035,302.55** | **89,883,742.26** |
| මුළු වත්කම් | | **164,862,825.53** | **215,961,321.57** | **226,848,039.51** |

| | | | | |
|---|---|---|---|---|
| වගකීම් | | | | |
| ජංගම නොවන වගකීම් | | | | |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | | 11,850,245.00 | 7,506,274.00 | 7,506,274.00 |
| සීමා සහිත අරමුදල් | 14 | - | 465,404.00 | 465,404.00 |
| ව්‍යාපෘති අතිරික්තය හෝ / (ඌනතාවය) | 15 - A | 1,592,113.43 | 2,705,318.94 | 5,924,566.82 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 15 - B | (322,549.73) | (177,049.73) | (10,770,674.73) |
| | | **13,119,808.70** | **10,499,947.21** | **3,125,570.09** |
| ජංගම වගකීම් | | | | |
| උපචිත ගිණුම් | 16 | 11,244,109.98 | 25,505,747.39 | 39,026,448.57 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 17 | 1,041,850.14 | 944,850.14 | 944,850.14 |
| | | 12,285,960.12 | 26,450,597.53 | 39,971,298.71 |
| මුළු වගකීම් | | **25,405,768.82** | **36,950,544.74** | **43,096,868.80** |
| ශුද්ධ වත්කම් | | **139,457,056.72** | **179,010,776.84** | **183,751,170.72** |
| මූල්‍යනය වන්නේ | | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | **18** | 64,646,736.53 | 84,882,283.88 | 161,106,534.39 |
| ප්‍රාග්ධන සංචිත | | - | - | 2,153,119.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 2,895,000.00 | 3,860,000.00 | 13,000,000.00 |
| රඳවාගත් ඉපැයුම් | | 71,915,320.19 | 90,268,492.96 | 7,491,517.33 |
| | | **139,457,056.72** | **179,010,776.84** | **183,751,170.72** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රුපියල්)

| විස්තර තොරතුරු | සටහන් | 2017 | 2016 ගලපන ලද ගිණුම් | 2016 |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය) | | (18,498,672.77) | 126,328,600.53 | 29,701,310.73 |
| මුදල් නොවන සංචලනයන් | | | | |
| ක්ෂයවීම් | 8 | 22,753,655.63 | 17,342,828.91 | 15,758,474.58 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | | 779,041.10 | 3,474,228.26 | 3,474,228.26 |
| ක්‍රමක්ෂය වූ සුනාමි ආධාර ප්‍රදාන | | - | - | (7,253,000.00) |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | (98,103,450.04) | (65,660,692.66) | - |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | (4,332,453.39) | (1,559,734.31) | - |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන සංචිතය | | (2,153,119.00) | (2,153,119.00) | - |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | (10,105,000.00) | (9,140,000.00) | |
| ප්‍රාග්ධන - උපකරණ ප්‍රදාන | | 1,143,652.18 | - | - |
| රඳවාගත් ඉපැයීම් වල වැඩිවීම්/ (අඩුවීම්) | | 93,370,600.63 | (12,169,202.74) | - |
| ගෙවියයුතු ගිණුම්වල අඩුවීම් | | (27,782,338.59) | 3,742,805.19 | 17,263,506.37 |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම් | | 97,000.00 | (192,761.00) | (192,761.00) |
| තොග වැඩිවීම | | (20,604.72) | 174,444.12 | 174,444.12 |
| ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම් | | 20,204,055.65 | 2,819,037.20 | (3,216,462.78) |
| පූර්ව ගෙවුම් වැඩිවීම් | | 1,980,751.31 | (2,074,913.33) | (2,077,913.33) |
| පාරිතෝෂික දායකය | | 4,522,658.50 | 1,577,313.04 | 1,577,313.04 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(16,144,223.51)** | **62,508,834.21** | **55,209,139.99** |

| | | | | |
|---|---|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (22,274,875.02) | (33,534,830.07) | (33,534,830.07) |
| කල්බදු ඉඩම් මිලදී ගැනීම් | | - | (18,317,757.08) | (18,317,757.08) |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් | | (920,553.29) | 31,909.30 | 31,909.30 |
| ආයෝජන ප්‍රතිලාභ | | 1,694,417.55 | 5,923,857.95 | 4,469,934.05 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(21,501,010.76)** | **(45,896,819.90)** | **(47,350,743.80)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | | |
| පාරිතෝෂික ගෙවීම | | (178,687.50) | (73,425.00) | (73,425.00) |
| සීමිත අරමුදල් වල වැඩිවීම් / (අඩුවීම්) | | (465,404.00) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 500,000.00 | - | 10,563,557.85 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(144,091.50)** | **(73,425.00)** | **10,490,132.85** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | (37,789,325.77) | 16,538,589.30 | 18,348,529.03 |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | 42,046,055.76 | 23,697,526.73 | 23,697,526.73 |
| **වර්ෂය අග මුදල් සහ මුදල්වලට සමාන දෑ** | **13** | **4,256,729.99** | **40,236,116.03** | **42,046,055.76** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(රුපියල්)

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|
| **2016 ජනවාරි 01 දිනය ශේෂය** | **150,542,976.54** | **2,153,119.00** | **13,000,000.00** | **(23,890,904.83)** | **141,805,190.71** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | - | - | - | - | - |
| **2016 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **150,542,976.54** | **2,153,119.00** | **13,000,000.00** | **(23,890,904.83)** | **141,805,190.71** |
| **විස්තීර්ණ ආදායම** | | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 31,382,422.16 | 31,382,422.16 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම | 10,563,557.85 | - | - | - | 10,563,557.85 |
| **2016 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය** | **161,106,534.39** | **2,153,119.00** | **13,000,000.00** | **7,491,517.33** | **183,751,170.72** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | (76,224,250.51) | (2,153,119.00) | (9,140,000.00) | 82,776,975.63 | (4,740,393.88) |
| **2017 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **84,882,283.88** | - | **3,860,000.00** | **90,268,492.96** | **179,010,776.84** |
| **විස්තීර්ණ ආදායම** | | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | (18,353,172.77) | (18,353,172.77) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20,235,547.35) | - | (965,000.00) | - | (21,200,547.35) |
| **2017 දෙසැම්බර් 31 දිනය ශේෂය** | **64,646,736.53** | - | **2,895,000.00** | **71,915,320.19** | **139,457,056.72** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. වීඑල්/සී/එන්සීපීඒ/2017/01/70 | මබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 ඔක්තෝබර් 17 දින

සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 22(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වර්ෂයට අදාළ ක්ෂය ලෙස රු. 22,414,241 ක් දක්වා තිබූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු. 22,753,655 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 339,414 කින් ඌන ගණනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් ස්ථාවර වත්කම් වටිනාකම වූ රු. 22,692,724 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු. 22,274,875 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 417,843 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) කාරක ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී නැවත ප්‍රකාශ කල (Restated) අගයන් වෙනුවට එම ගැලපීම් කිරීමට පෙර අගයන් සැලකිල්ලට ගැනීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 19,559,200 කින් සහ මුදල් හා මුදල්වලට සමාන දෑ රු. 1,809,940 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂවලට අදාලව සිදු කරන ලද වැරදි නිවැරදි කිරීම් හේතුවෙන් 2016 වර්ෂයේ ලාභය රු. 96,627,290 කින් හෙවත් සියයට 325 කින් වැඩි වී තිබූ නමුත් එම වැරදි නිවැරදි කිරීම්වලට අදාල නැවත ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් ප්‍රමිතියේ 54 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සිදු කලයුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 33,202,652 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ව්‍යාපෘති අරමුදල් 10 කට අදාලව දිගු කාලයක සිට පැවති ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් ව්‍යාපෘති අරමුදල් හතරක එකතුව රු. 1,657,001 ක හර ශේෂ සහ අරමුදල් හයක එකතුව රු. 3,249,114 ක බැර ශේෂ ඇති වී තිබූ අතර, එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව එකිනෙකට හිලව්කර රු. 1,592,113 ක් වූ ශුද්ධ බැර ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් කල් බදු පදනම යටතේ රු. 18,317,757 ක් වටිනා ඉඩමක් මිලදී ගෙන තිබූ අතර, එම ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනීත කිරීමකින් තොරව සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ එම වර්ෂයේ ආදායමට ලියා හැර තිබුණි. එම වරද සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම් රු. 129,984 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා ළමා ආරක්ෂක අරමුදල අතර සිදුවන අන්තර් ගනුදෙනු නිසි පරිදි සටහන් නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය අනුව අධිකාරියට අරමුදලින් ලැබිය යුතු ශේෂයේ රු. 842,874 ක හා අධිකාරියෙන් අරමුදලට ගෙවිය යුතු ශේෂයේ රු. 3,236,982 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ළමා ආරක්ෂක අරමුදලින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ගෙවිය යුතු ශේෂය ලෙස රු. 6,739,327 ක් වසර 3 කට අධික කාලයක සිට ද, අරමුදලින් අධිකාරියට ලැබිය යුතු ශේෂය ලෙස රු. 7,582,201 ක් වසර 3 කට අධික කාලයක සිටද පැවත එන නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින යුනිසෙෆ් හා සේව් ද චිල්රන්ඩ් අරමුදල්වලින් පිළිවෙලින් 2006 හා 2013 වර්ෂවල සිට ලැබිය යුතු ලෙස රු. 235,379 ක් හා රු. 256,510 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, එම ශේෂ අයවීම අවිනිශ්චිතව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂය තුල පැවති රු. 252,387 ක අත්තිකාරම් වර්ෂ දෙකකට අධික කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 104(1),(3) | සමාලෝචිත වර්ෂය තුළදී සිදු වූ වාහන අනතුරක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිජ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු. 39,401,325 ක් වටිනා පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 18,498,673 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 126,328,601 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 144,827,274 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂවලට අදාලව ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය රු. 87,517,369 ක ගැලපීම් ඇතුලත්ව 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබීම හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු. 96,627,290 කින් වැඩි වීම හා ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු ප්‍රතිපාදන රු. 114,583,496 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2014 හා 2016 වර්ෂවල දී අධිකාරිය පිළිවෙලින් රු. 3,631,016 ක හා රු. 126,328,601 ක අතිරික්තයන් ලබා තිබූ අතර 2013, 2015 හා 2017 වර්ෂවල දී පිළිවෙලින් රු. 1,302,856 ක, රු. 1,011,985 ක හා රු. 18,498,673 ක ඌනතාවයන් ලඟා වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 36,258,920 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 212,628,898 ක් දක්වා ධනාත්මකව වර්ධනය වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව පැවති නෛතික සිද්ධි**

අධිකාරියේ සේවය කළ ගණකාධිකාරිණිය 2010 අගෝස්තු 25 දින සිට වැඩ තහනමට ලක් කර තිබූ අතර, ඇය විසින් අධිකාරියට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකල නඩුවක් විභාග වෙමින් පැවතුනි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය පිහිටුවා වර්ෂ 20 ක් ගත වී තිබුණ ද, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතට අනුව, ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාරවලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට සමාලෝචිත වර්ෂයේ දී ද ක්‍රියාකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී අධිකාරිය වෙත ළමා අපචාර, අපයෝජන, හිංසන, නොසලකා හැරීම් හා ළමා ශ්‍රමික සම්බන්ධයෙන් පැමිණිලි 9,014 ක් ලැබී තිබූ අතර, 2018 පෙබරවාරි 15 දින වන විට එම පැමිණිලිවලින් 2,613 ක් සඳහා පමණක් විසඳුම් ලබාදී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පැමිණිලිවලින් සියයට 71 ක් විසඳා නොතිබූ අතර, 2011 වර්ෂයේ සිට 2015 කාලය තුල ලැබී තිබූ පැමිණිලි 63,189 කින් සියයට 55 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විසඳා නොතිබුණි. අධිකාරියට ලැබෙන මහජන පැමිණිලි වාර්තා කිරීම සඳහා නිලධාරීන්ට ලැප්ටොප් 273 ක් හා මුද්‍රණ යන්ත්‍ර 269 ක් ලබා දීම සඳහා රු. 118,715,129 ක් සමාලෝචිත වර්ෂයේ දී වැය කර තිබුණ ද, අධිකාරිය වෙත වසරක් පාසා ලැබෙන පැමිණිලි වලට සම්බන්ධ තොරතුරු රැස්කර වාර්තා කිරීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් නිලධාරීන්ගේ ඇති අකාර්යක්ෂමතාවය, තොරතුරු කැඳවීම හා විමර්ශන කටයුතු පිළිබඳ පසුවිපරම් නොකිරීම හා නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම යනාදිය නිසා නොවිසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වී තිබුණි.

(ඇ) අධිකාරිය මගින් පිළියෙල කර තිබූ ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් 51 ක් වෙනුවෙන් රු. මිලියන 48 ක් වෙන් කර තිබූ නමුත්, එයින් රු. මිලියන 3.6 ක ප්‍රතිපාදන සලසා තිබූ කාර්යයන් 10 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ක්‍රියාකාරකම් 13 ක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 16 ක ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 23 ක වියදම් දරා තිබුණි. තවද රු. මිලියන 3.5 ක ප්‍රතිපාදන සලසා තිබූ කාර්යයන් 5 ක් ක්‍රියාත්මක කර තිබුණ ද, එම කාර්යයන් ක්‍රියාත්මක කිරීම තුලින් අපේක්ෂා කර තිබූ අරමුණු ළඟා කර ගෙන නොතිබුණි.

(ඈ) ළමා ආරක්ෂාව ශක්තිමත් කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේදී කාර්යයන් 13 ක් වෙනුවෙන් රු. මිලියන 33 ක් වෙන් කර තිබුණි. ඉන් රු. මිලියන 5.7 ක ප්‍රතිපාදන සලසා තිබූ කාර්යයන් 5 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ක්‍රියාකාරකම් 3 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු. මිලියන 11.5 ක් ඉක්මවා රු. මිලියන 18 ක් වියදම් දරා තිබුණි. තවද රු. මිලියන 2.5 ක් ප්‍රතිපාදනය කර තිබූ කාර්යයන් 2 ක් ක්‍රියාත්මක කර තිබුණ ද, එමගින් ළඟා කර ගැනීමට අපේක්ෂා කර තිබූ අරමුණු ළඟා කර ගෙන නොතිබුණි.

(ඉ) ළමුන් සඳහා සමාජ ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යටතේ කාර්යයන් 12 ක් වෙනුවෙන් රු. මිලියන 23.48 ක් වෙන් කර තිබුණි. ඉන් රු. මිලියන 1.013 ක් ප්‍රතිපාදනය කරන ලද කාර්යයන් 5 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබූ අතර රු. මිලියන 9.1 ක ප්‍රතිපාදනය කරන ලද කාර්යයන් 4 ක් ක්‍රියාත්මක කර තිබුණ ද, වර්ෂය තුළ අදාල අරමුණු ඉටු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අධිකාරියේ හිටපු නියෝජ්‍ය සභාපතිවරයාගේ ඉල්ලීමක් මත, 2017 අප්‍රේල් 07 දින අධිකාරියේ සහකාර කළමනාකරු (නීති) නිලධාරියා අත්සන් කර තිබූ දිවුරුම් ප්‍රකාශයක් මඟින් ශ්‍රී ලංකා ජනරජයේ ළමා ආරක්ෂාව සහ ළමා අපයෝජනය වැළැක්වීම සඳහා ඇති රජයේ යාන්ත්‍රණය සහ අධිකරණ පද්ධතිය යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය විවේචනයට ලක්කර තිබූ බව දක්වා හිටපු සභාපතිනිය විසින් 2017 ජූනි 20 දින සිට එම නිලධාරිනිය වැඩතහනමට ලක් කර තිබුණි. දිවුරුම් කොමසාරිස්වරියක ලෙස සහකාර කළමණාකරු (නීති) ගේ වගකීම තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු දිවුරුම් කොමසාරිස්වරුන් පත් කිරීමට අදාලව අධිකරණ අමාත්‍යාංශයේ පවතින නීතිරීති උපදෙස් හා "දිවුරුම් සහ සන්තකරු නීතිය" පිළිබඳ ආඥාපනතේ දැක්වෙන කරුණු

අවධානයට ලක් නොකර, අදාල කාර්යය සඳහා සෘජු වගකීමක් පැවරීමට හැකියාවක් නොමැතිව එම නිලධාරිනියගේ වැඩතහනම්කර තිබුණි.

අධිකාරියේ 1929 දරන දුරකථන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා අදාල ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට නිර්දේශ ලබා ගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත 2016/2017 වර්ෂවලදී රු.900,000 ක් ගෙවා තිබුණි. එහෙත් එම වාර්තාව ලබා දී වර්ෂයක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 4.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත නිදහස් කළ අධිකාරියේ සම්පත්

අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (වැඩසටහන්) තනතුර දැරූ නිලධාරිනිය වසර 8 කට වැඩි කාලයක සිට වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කිරීමේ පදනම මත අමාත්‍යාංශයක සේවය සඳහා මුදා හැර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තනතුර සඳහා වෙනත් නිලධාරියෙකුගේ සේවය ලබා ගෙන නොතිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රධාන තනතුරු 4 ක් වර්ෂ 7 ක කාලයක සිට පුරප්පාඩුව පැවතීම, එහි කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය නිසි පරිදි සිදු නොවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම සහකාර අධ්‍යක්ෂ(නීති) වැඩතහනමට ලක්ව එම තනතුර පුරප්පාඩු වී තිබුණු අතර, පැමිණිලි විසඳීම හා නීති කටයුතු සම්බන්ධ කාර්යයන් විධිමත් පරිදි සිදු වී නොතිබුණි.

(ආ) කණිෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක පුරප්පාඩු හේතුවෙන් අධිකාරියේ දෛනික කාර්යයන් පවත්වා ගෙන යාමේ දී හා නිලධාරීන් නිවාඩු ලබා ගැනීමේ දී එම කාර්යයන් ඉටු කර ගැනීමේ ප්‍රමාදයන් හා ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී තනතුරු 116 ක් සඳහා සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගත් අයදුම්කරුවන් වෙත 2017 දෙසැම්බර් 14 දින තෝරා ගත් බවට ලිපි යවා තිබූ නමුත්, විගණන දිනය වූ 2018 ජූනි 30 වන විටත් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩුව පැවතීම අධිකාරියේ කාර්යභාරය සාර්ථක ලෙස ඉටු කිරීමට බාධාවක් ලෙස නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ජී/2009(1) හි 3 ඡේදයට අනුව, අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත නොකිරීම හේතුවෙන් අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු සීමා වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර විගණන විමසුම් 12 නිකුත් කර තිබූ නමුත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කළමනාකරණ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**6.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 33 හි 2.14.1 වගන්තිය පරිදි රු. 100,000 දක්වා පමණක් වූ භාණ්ඩ හා සේවා සඳහා පමණක් සෘජු මිලදී ගැනීම් ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියාට තීරණ ගැනීම් සිදු කල හැකි වුවත්, ඊට පටහැනි ලෙස ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය සැමරුම වෙනුවෙන් මිලදී ගෙන තිබුණු රු. 160,656 ක් වටිනා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියට පටහැනි ලෙස හදිසි කාර්යයන් ලෙස සලකා සෘජු මිලදී ගැනීම් යටතේ මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ආ) 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) ප්‍රකාරව කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකේම සේවය නොකල යුතුය. එහෙත් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ගුරුවරුන් පුහුණු කිරීමේ දී ගුරු උපදේශකයින්ට භාවිතා කිරීම සඳහා රු. 1,249,245 ක් වැය කර වීඩියෝ පට 3 ක් නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ප්‍රසම්පාදන කමිටුවේ මෙන්ම තාක්ෂණික ඇගයීම් කමිටුවේ ද සභාපති ලෙස වැඩසටහන් අංශයේ කළමණාකරු කටයුතු කර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.8.4 (ඉ) ඡේදයට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති යටතේ සිටින වැඩසටහන් සහායක ද එම කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ඇතැම් ගිණුම් ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පැවතීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |
| (ඇ) මෙහෙයුම් පාලනය | (i) පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමේ ප්‍රමාදයන් හා පැවැත් වූ වැඩසටහන් පිළිබඳ ප්‍රගතීන්, පසුවිපරම් කටයුතු හා නිසි අධීක්ෂණයන් සිදුකර නොතිබීම. |
| | (ii) නිසි සැලසුම් කිරීමකින් තොරව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සැලසුම් කල වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති